00232

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - **2020/2021**
**EPU6230** - ප්‍රාථමික පාසල් සැකසුම් තුළ අන්තර්කරණ අධ්‍යාපනය
කාලය - පැය දෙකයි. **(02)**

---

දිනය - **2023.03.11** වේලාව - ප.ව.**01.30** - ප.ව.**03.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පමණක් පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. 'අන්තර්කරණ අධ්‍යාපනය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? නිර්වචනයක් සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ අධ්‍යාපනයේ මූලධර්ම තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න.

03. අන්තර්කරණ අධ්‍යාපනයේ නැගී එන ප්‍රවණතා කෙටියෙන් පැහැදිලි කරන්න.

04. විශේෂ අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබන විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ විවිධ කාණ්ඩ ලැයිස්තුගත කර, ඔවුන්ගෙන් එක් අයකු පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

05. Gifted ළමුන් සහ දීප්තිමත් ළමුන් අතර වෙනස පැහැදිලි කරන්න.

06. නවීකරණය සහ ඉඩකඩ සැපයීම (modification and accommodation)යන සංකල්පවල වෙනස්කම් පැහැදිලි කරන්න.

07. ඉගෙනුම විවිධාංගීකරණය (differentiated instructions) යන්න කෙටියෙන් විස්තර කරන්න.

08. සාමාන්‍ය පන්තිකාමරවල විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වූ Salamance UNESCO, 1994 සමුළුවේ අරමුණු පිළිබඳව ඔබේ අදහස කුමක් ද?

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) රමේෂ් 3 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඉගෙනීමේ ආබාධ සහිත ශිෂ්‍යයෙකි. ඔහුට එම ශ්‍රේණියේ කියවීමේ පොත කියවිය නොහැක. රමේෂ්ට ඇති කියවීමේ ගැටළු මොනවාදැයි ලැයිස්තු ගත කරන්න. (ලකුණු 08)

(ii) ප්‍රාථමික ගුරුවරයකු ලෙස රමේෂ්ගේ කියවීමේ ගැටළු අවම කර කියවීම වැඩි දියුණු කිරීමට ඔබ කරන යෝජනා මොනවා ද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) පන්ති කාමරයක සිටින විවිධ ඉගෙනුම ලබන්නන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) නිමාලි 4 ශ්‍රේණියේ ඉගෙනුම ලබයි. ඇය අවධානයෙන් කාර්යයන්වල යෙදී සිටින නමුත් බොහෝවිට ඇයට නියමිත කාලය තුළ වැඩ කිරීමට නොහැකි වේ. ඇයට විෂයයන් තේරුම් ගත හැකි නමුත් විභාගය පැමිණෙන විට ඇය විෂයන් පිළිබඳ ව ප්‍රගුණ කර නැත. නිමාලිගේ ශ්‍රේණියේ හැකියාවන්, ඇය පන්තියට අනුකූල බව සහතික කිරීම සඳහා ඵලදායී ගුරුවරයෙකුට විභාගවල දී භාවිත කළ හැකි අනුවර්තනය (adaption) කුමක් ද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (i) "විෂයමාලා අනුවර්තනය" යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) විවිධ සිසුන්ගේ අවශ්‍යතා අනුව අනුවර්තන වර්ග නවය (09) යොදන්නේ කෙසේ ද? (ලකුණු 12)

12. (i) ඔබ ඔබේ පන්ති කාමරය තුළ සහයෝගී ඉගැන්වීම් ක්‍රියාත්මක කිරීමට යන ආකාරය පිළිබඳ සංකල්ප සිතියමක් අඳින්න. (ලකුණු 10)

(ii) සහයෝගීතා ඉගෙන්වීම් ආකෘති, ශිෂ්‍ය ජයග්‍රහණවලට සහ ඔබේ ඉගැන්වීමට බලපාන ආකාරය ඔබ දකින්නේ කෙසේ ද? යන්න විස්තර කරන්න. (ලකුණු 10)

13. (i) අන්තර්කරණ අධ්‍යාපනයේ අන්තර්ගත විවිධ ආකෘති නම් කර, ඒවායේ ලක්ෂණ නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඉහත සඳහන් කළ ආකෘතින් හතරක් **(04)** තෝරා ගෙන අන්තර්කරණ අධ්‍යාපනයේ දී මෙම ආකෘති හතරේ ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.